


# උත්තමාචාරය

"හැම පාර්ශවයක්ම භූමියෙන් කොසකට අයිතිවාසිකම් කියන්නාවූ භේදභින්න දේශයක ජනතාවට අනුකම්පා වේවා" ඒ දාර්ශනිකයකු හා කවියකු වූ කලීල් ජිබ්රාන් කරන ලද ප්‍රකට කියමනකි. මෙම ප්‍රකාශයේ සෝ බර සත්‍ය පසු-ගිය දශක තුනකට ආසන්න කාලයක් ශ්‍රී ලාංකික පොළොව මත අප අත්වින්දෙමු. බෙදුම්වාදයේ කුරිරු අණසක මව්බිමේ සෑම පස් පිඩක් ම භීතියට පත්කොට තිබුණි. ඒ අනුව එයට එරෙහිව කරනු ලබන සටන වූ කලී නිරර්ථක හා භයානක ප්‍රතිවිපාක ගෙන දෙන ක්‍රියාවකැයි යන ප්‍රවාදය දේවභාෂිතයක් ලෙස දේශපාලන ශබ්ද කෝෂයට එක් කරන්නට ඇතැම් දේශපාලකයන්ට හැකිවිය. එහෙත් මැයි මස 18 වනදා අප ඒ අසත්‍යයේත් භීෂණයේත් අන්ධකාරය පරාජයකොට නිදහසේ පළමු හිරු එළිය වින්දනය කළෙමු. එබැවින් මව් බිමට පෙම්බැඳි ශ්‍රී ලාංකිකයෙකු සිය මාතෘ භූමිය උදෙසා එතරම් සතුටට පත් වූ දිනයක් තම දිවිය තුළ ඇතැයි මම නොසිතමි.

මෙම සන්තෘෂ්ටිය උදාකරගනු වස් අපට අහිමි වූ අභීත ශ්‍රී ලාංකික ජීවිත ගණනින් සුළුපටු නොවේ. මෙම විජයග්‍රහනය වූ කලී ශ්‍රී ලාංකික ඉතිහාසයේ විශිෂ්ඨතම සංග්‍රාමික මෙහෙයුම බවට විවාදයක් නැත. එය හුදෙක් අවිගත් ත්‍රස්තවාදී කල්ලියක් හා පමණක් කරනු ලැබූ සංග්‍රාමයක් නොවීය. එය අධිරාජ්‍යවාදී මහමොළකාරයින්ගේ බෙදුම්වාදී න්‍යායපත්‍රය සමගද කළ බිහිසුණු සටනක් විය. රාජපක්ෂ පාලනයට පෙර බලයට පත් වූ සියලු ශ්‍රී ලාංකික නායකයින් භීතියට පත්කොට පරාජයට පත්කරන්නට එම බෙදුම්වාදී නඩය බලවත් වූ අතර එය ප්‍රභාකරන්ගේ ඊනියා රාජ්‍යයේ දේශසීමා ශ්‍රී ලාංකික භූමියෙන් තුනෙන් එකක් දක්වා පුළුල් කළේය. එහෙත් මහින්ද රාජපක්ෂ පාලනය ප්‍රභාකරන්ගේ ම්ලේච්ඡ ත්‍රස්තවාදයත් එයට ගැති බෙදුම්වාදී ජාත්‍යන්තරයත් සැලසුම් සහගතව පරාජයට පත්කොට තිබේ. එය අධ්‍යතන යුධ විශේෂඥයින්ට ගවේශනය කළ යුතු නව සංග්‍රාමික විෂය ක්ෂේත්‍රයක් විවර කරදී ඇතැයි මම සිතමි. මන්ද එම යුද්ධය හුදෙක් අවිගත් පිරිසක් සමඟ පමණක් සිදුවූ එකක් නොවන බැවිනි. බලවත් රටවල මදිපුංචිකම් ඉවසමින් හා ඔවුනට එරෙහිව යාමේ අවධානම ද දරමින් එම මතවාදී අරගල ප්‍රඥාවෙන් හා සෘජු ප්‍රතිපත්තියෙන් යුතුව මර්ධනය කරන අතරම ප්‍රභාකරන්ගේ ත්‍රිවිධ හමුදාවට මුහුණ දීම වූ කලී කවර නම් අසීරු ඉලක්කයක් වන්නට ඇද්ද ?කෙසේ නමුත් අවසානයේදී ප්‍රභාකරන් නන්දිකණ්ඩාල් කළපුවේ ඇදවැටුනේ සිය ම්ලේච්ඡත්වය සමඟ පමණක් නොව එම ගොරතර බෙදුම්වාදී ජාත්‍යන්තර න්‍යායපත්‍රයද සමගිනි.

ශ්‍රී ලාංකික ආණ්ඩුවක් මෙතරම් තිරසාර ලෙස නිශ්චිත අරමුණක් වෙත ප්‍රඥාවෙන් හා වීර්යයෙන් ගමන් කළ ඉතිහාසයක් නිදහසින් පසු අපට උරුම නොවීය. මාවිල් ආරු සිට නන්දිකණ්ඩාල් කලපුව දක්වා වූ එම සංග්‍රාමික චාරිකාව ශ්‍රී ලාංකික ඉතිහාසය නැවත ලියන්නක් වන්නේ එබැවිනි. මෙම ගමනේදී ශ්‍රී ලාංකික ත්‍රිවිධ හමුදාවේ අභීත කැපවීම හා ජීවිත පරිත්‍යාගය විශිෂ්ඨ වන්නේ යම් සේද රාජ්‍ය නායකයා ලෙස මහින්ද රාපක්ෂ ජනාධිපතිවරයාගේ කාර්යභාරයද ඊට නොදෙවෙනි වෙයි. සංග්‍රාම භූමිය සවිබල ගන්වන අතර ඔහුට රට තුළ නිර්මාණය වන ආර්ථික අවපාතය මෙල්ලකරගත යුතු විය. එමෙන්ම දේශීය මෙන්ම විදේශීය සතුරන්ට මතවාදීව මුහුණ දීම සුළුපටු අභියෝග යක් නොවූ අතර පාර්ලිමේන්තු බහුතරය පවත්වාගෙන යාම සඳහා දූෂිතයන්ට පවා වරදාන වරප්‍රසාද ලබාදීමට ඔහුට සිදුවිය. ලොව සුවිසල්ම කැබිනට් මණ්ඩලයේ අසීමිත බර උසුලාගන්නට ජනාධිපතිවරයාටත් මහජනයාටත් සිදුවූයේ මෙම සංක්‍රාන්තික කාලය ගෙවා දමනු පිණිස බව මගේ හැඟීමයි.

**ශ්‍රී ලාංකික ආණ්ඩුවක් මෙතරම් තිරසාර ලෙස නිශ්චිත අරමුණක් වෙත ප්‍රඥාවෙන් හා වීර්යයෙන් ගමන් කළ ඉතිහාසයක් නිදහසින් පසු අපට උරුම නොවීය. මාවිල් ආරු සිට නන්දිකණ්ඩාල් කලපුව දක්වා වූ එම සංග්‍රාමික චාරිකාව ශ්‍රී ලාංකික ඉතිහාසය නැවත ලියන්නක් වන්නේ එබැවිනි. මෙම ගමනේදී ශ්‍රී ලාංකික ත්‍රිවිධ හමුදාවේ අභීත කැපවීම හා ජීවිත පරිත්‍යාගය විශිෂ්ඨ වන්නේ යම් සේද රාජ්‍ය නායකයා ලෙස මහින්ද රාපක්ෂ ජනාධිපතිවරයාගේ කාර්යභාරයද ඊට නොදෙවෙනි වෙයි.**

ජනාධිපතිවරයා යුධ ජයග්‍රහණයෙන් පසු ජාතිය අමතා කළ කථාව තුළ ඔහු ගත කළ පීඩාකාරීවූත් අධිෂ්ඨානපූර්ණ වූත් ගමනේ ගාම්භීරත්වය කැටිව තිබුණි. එය මගේ ජීවිත කාලය තුළ ශ්‍රී ලාංකික රාජ්‍ය නායකයකු සිදුකළ විශිෂ්ඨතම පාර්ලිමේන්තු කතාව බව මම සිතමි. එය එපමණටම ආදරණීය විය. හැඟීම්බර විය. ප්‍රඥාගෝචර විය. එඩිතර හා ගෞරවනීය විය.

අලුත් රටක දෙවැනි සංග්‍රමය අරඹන්නට දැන් කාලය පැමිණ තිබේ. ඒ ආර්ථික සංග්‍රාමයයි. එය සාර්ථක ලෙස ජයගත් බිමක යළි ප්‍රභාකරන් කෙනෙකුගේ උපතක් සිදුවිය නොහැකිය. සියලු බෙදුම්වාදී බීජ හටගනු ලබන්නේ අයහපත් ආර්ථික දේශගුණය තුළ බව මම විශ්වාස කරමි. එසේ හටගනු ලබන බීජ ලොකු මහත් වන්නේ ඊට එක්කරනු ලබන විසකුරු මිනිස් උවමනාවන් නැමැති පොහොර එකතුවීමෙනි. මෙම විසකුරු මිනිස් උවමනාවන් යළි මව්බිම පතිත නොවන්නට ජාති භේද දුරැර සියලු ශ්‍රී ලාංකිකයෝ එක්ව වැඩ කළ යුතුව තිබේ. එම ගමනට නිසි නායකත්වයක් ලැබී ඇති වටපිටාවක අප කුමට තවත් උකටලිව කල්ගෙවමුද ? පක්ෂයට හා ජාතියට වඩා රට ඉදිරියෙන් තබාගෙන කටයුතු කරනු ලබන හැම පැයක්ම දේශයේ හෙට දවස නිර්මාණය කරනු ඇති බව මගේ හැඟීමයි. නිවී ගිය මනුෂ්‍යත්වයේ හා ආර්ථික සමෘධියේ පහන යළි දල්වන්නට පෙළගැසෙමු. ඒ සඳහා මාතෘ භූමියට ඔබේ මිනිස්කමත්, ශ්‍රමයත් අවශ්‍ය වී තිබේ.



රවී සිරිවර්ධන
ravi.siriwardhana@gmail.com

# දෙලොවටම වැඩක් නැති අපේ මිනිස්සු

දශක තුනක් පමණ බැට කෑ සිංහල සහ ඊලාම් යුද්ධය නිමාවට පත් වූ මේ මොහොතේ ඉහවහා ගිය සතුටින් ද ඒ හා සමානව දැනෙනා කනස්සල්ලකින් ද යුතුව මෙම ලිපිය ලියන්නට මම අත ගැසුවෙමි.

පළමුව ශ්‍රී ලාංකිකයකු හැටියට කොන්ද පණ ඇතිව, මුල අමතක නොකර කාලයත් සමඟ සියල්ල අමතක වන කොහේදෝ සිට මුල් බැසගත් 'සිංහලයාගේ' ගති පැවතුම සහමුලින්ම වෙනස් කොට, මුල සිට අග දක්වා නමුදු කිසිදා අපට ගෙවිය නොහැකි ණයක් ඉතිරි කළ, අප වීරෝධාර රණවිරුවණි, සටනින් දිවි පිදූ සහ රණබිමේ ඉතිරි වූ රණවිරුවණි, ඔබ එකිනෙකා ළඟට ගොස් දණ නමා, අචාර කළද කම් නැත. ඔබ වැනි දිරිය දූ පුතුන් අපට නැත්නම් කවුරු සිටියත් අපි තාමත් එක තැනය හෝ අපට අද රටක් නැත.

එය එසේ වෙද්දී අනෙක් පසින් සාමාන්‍ය සිංහල ජනයා එකා මෙන් දුන් දිරිය අප්‍රමාණයි.

ඒ සිංහල අපේ කමට නැගී සිටියද කනස්සලු සහගත සටහන වනුයේ මෙල්බන් නගරයේ,

කිසිම බලවේගයකට යටත් නොවී යුද්ධය නැමැති කොටි වලිගය කපා දැමූ අපගේ අතිගරු ජනාධිපතිතුමනි ඔබට තෙරුවන් සරණනින් සදා ජය හා ශක්තිය !

එමෙන්ම මෙම සටන කරට කර නියම පුරුෂයෙකු සේ සහයෝගය දුන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමනි, සුද්දන්ගේ පිටුපසට ගොස් ඉඳුල් ලෙවකන, සුද්දා ඉර පෙන්වා හඳ කීවත් පිළිගන්නා, ඔවුන් කියන සෑම දෙයක්ම ඉස් මුදුනින් පිළිගන්නා සිංහලයන් බිහිවූ යුගයක ඔබ වැනි මහත්මයන් සදා අමරණීයයි.! කිසිම විදේශ හෝ බලවේගයකට යටත් නොවී කරට කර අප රට ජාතිය වෙනුවෙන් නැගී සිටි ඔබට අපේ සදා උත්තමාචාරය !

එමෙන්ම මෙම මෙහෙයුම අති සාර්ථක මෙහෙයුමක් කර දුන් ත්‍රිවිද හමුදාපතිවරුවනි ඔබලාටද අප සදා ණය ගැතිය. අවසානයේ අපේ සිංහල මිනිසුන් යුද්ධය මොනවා වුවාද කියාවත් නොදැන සිටීමය. නැතහොත් ලංකාවේ යුද්ධය අවසන් යැයි දැන ගන්නේ SDS OR CHANAL 9 NEWS වලින් වීමය.

හැදූ මව්බිමේ නිදහස් අධ්‍යාපනයට පින්සිදු වන්නට මෙල්බන් නගරයේ මුල් බැසගත් 99% පමණ වැඩිහිටි සිංහලයන් මා මුලින් සඳහන් කළ දෙලොවටම වැඩක් නැති මිනිසුන්ය. කණගාටුවකින් වුවද එවැනි මිනිසුන් කුමට බිහිවූවාද කියා අනේක වර මට සිතේ.

තම නිවස තම වාහනය හා තම මුදල් පසුම්බිය පමණක් තර කර, "අනේ ඕවට යන්න අපිට වෙලාවක් නෑ වැඩ වැඩ" කියනා මේ කොට්ඨාශ විහිළුවක් වනුයේ ලංකාවේ සිටි නළු නිළියන් පැමිණි විටය. ඔවුහු එවිට තමාගේ වැඩ රාජකාරී පවා අත හැර ඔවුන් බැලීමට යති, ඔවුන්ට නවාතැන් දීමට පොරකති.

එහෙත් පසුගියදා මෙල්බන් නගරයේ පැවැත්වූ ශ්‍රී ලාංකික රැළියට සහභා-ගී නොවීමට බහුතරයකගේ ' EXCUSE ' එක වූයේ "අනේ අපිට වැඩ වැඩ" කියාය. නැත්නම් "ඕවගේ මිනිස්සු වලි දා ගන්නවා...." කියාය. නළු නිළියන් ආ විට වලි පිට වලි ගියද කම් නැත.

IMTERNATIONAL STUDENT යයි හංවඩු ගැසූ තරුණ පරපුර සහ 1% පමණ වැඩිහිටි තවම රට හා ජාතිය ගැන කැක්කුමක් ඇති වැඩිහිටි පිරිසක් පමණක් එම අවස්ථාවට පැමිණ සිටියහ.

නිදහස් අධ්‍යාපනය මුළුමනින්ම අත් වුවත් එසේ මුණිවත රකිද්දී එම නිදහස හරි අඩක් අත්විඳ මෙහි විත් අධ්‍යාපනය ලබන තරුණ කැළ හෝ තම රට ජාතිය වෙනුවෙන් ඉතාම අවශ්‍ය වෙලාවකදී හඬක් නැගීම සතුටට කරුණකි. ත්‍රස්තවාදීන් වුවද දෙමළ ජනයා ළදරුවාගේ සිට මහල්ලා දක්වා පෙළපාලි යමින් හඬ නැංවුවද අප යන්තමින් විලි වසා ගත්තේ තරුණ කැළ හෝ එම අවස්ථාවට සහභා-ගි වීමෙනි.

සත්‍ය අසත්‍යබව කෙසේ වුවද අනෙක් කරුණ වනුයේ ශ්‍රී ලංකාව නියෝජනය කරන මෙරට සිටිනා 'තානාපති' නම් තනතුරට පත් වූ පුද්ගලයා කොහේ සිටියාද යන්නයි.

අසිරිමත් ජයග්‍රහණයක් සැබෑ නිදහසක් උදෙසා සටන් කර ජය ලැබූ මේ මොහොතේ කිසි විටක, අප ජාතිය වෙනුවෙන් එම පුද්ගලයා කථාකල අවස්ථාවක් නම් නෑසූ තරම්ය.

ත්‍රස්තවාදීන් වුවද තම ජාතිය වෙනුවෙන් නැගී සිට නානා ප්‍රකාර අසත්‍ය ප්‍රකාශ ඔවුන් එකතු කරද්දී අප තානාපති බොහෝවිට මුනිවත රැක්කේ කුමක් රැකීමේ අරමුණකද්ද ? එහෙත් එය රට රැකිමේ අරමුණින් නම් නොවන බව නම් සක් සුදක් සේ පැහැදිලිය.

මෙම සටහන නිමාවට ප්‍රථමයෙන් මා යමක් සටහන් කරන්නෙමි. 'තමන්ගේ මට්ටම් තම්මට්ටම්' කියන්නා සේ මෙය කියවූවන් හිතමා යම් ගොන්නට වැටෙන්නේ ද යන්න තමා දනී. නිදහසට කරුණු කෙසේ කීවද තම කී දෙනෙකුට ඇඟිල්ල දිගු කලද බහුතර වැඩිහිටි සිංහල යැයි කියූ ශ්‍රී ලාංකාවේ ඉපදී නමට සිංහල වූ ඔබලා රට ජාතියට තමා අවශ්‍යම කරනා වෙලාවක දෙලොවටම වැඩක් නැති ආත්මාර්ථකාමී නිහඬ තම ජාම බේරා ගන්නා ප්‍රතිපත්තියක් අනුගමනය කළෝය.

යුද්ධය නිමා වී නව උපතක් ලැබූ සිරිලකට දණ ගසා නැගී සිටීමට දැන්වත් ඔබලාගේ පුහුමාණය අපෝ ලංකාව හරි රස්නෙයි, ලංකාව හරි අපිරිසිඳුයි, පාරේ යන්න බෑ යන POSH වෙන්නට අර අඳිනා විකාර අත හැර දමා අත දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. උපන් රට යැයි අමතක නොකර වචනයෙන් නොව ක්‍රියාවෙන් යමක් කර තමා හැදූ වැඩූ පොළවේ ණය බිඳක් හෝ ගෙවන්නට මෙන් ඉල්ලමි.

*චිරං ජයතු ශ්‍රී ලංකා !*

අසංකා ජයවීර
මෙල්බන්